**තණමල්විල ප්‍රාදේශීය සභාව - 2023**

----------------------------------------

# 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

## 1.1 <u>ව්‍යාවනය කළ මතය</u>

තණමල්විල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

තණමල්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 <u>ව්‍යාවනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළ කරනු ලැබේ.

## 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සභාව විසින් අනුගමනය කළ තොග අගය කිරීම, ආදායම් හඳුනා ගැනීම සහ කෙරීගෙන යන වැඩ ගිණුම්ගත කිරීමට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල ගිණුම්කරන ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී වැඩ අවසන් කරන ලද කර්මාන්ත 02කට අදාලව රු. 12,595,688 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | ඉදිරියේදී මෙම මුදල ගිණුම්ගත කරන බව. | වැඩ අවසන් කරන ලද කර්මාන්තවල වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් රු. 15,000,000 ක ඩංඩුම පොදු වෙළඳපල, රු. 200,000 ක නෙළුම් වැව ජල ව්‍යාපෘතිය සහ රු. 800,000 ක ආනන්දගම ජල ව්‍යාපෘතිය ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු සියලු වත්කම් වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකය රු.1,834,191,813 ක් වුවත් දේපල පිරියත උපකරණ යටතේ රු. 1,845,256,295 ක් වීමෙන් ශේෂයන් අතර රු. 11,064,482 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී මෙම ගිණුම් ශේෂයන් හා එහි උපලේඛන සසඳා ශේෂයන් අතර වෙනස තුලනය කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගත් පුස්තකාල පොත් වටිනාකම රු. 380,989 ක් අඩුවෙන් පුස්තකාල පොත් ගිණුමට ගෙන තිබුණි. | 2024 වර්ෂයේදී මෙම වරද නිවැරදි කරන බව. | සභාව සතු වත්කම් වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 147,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී මෙම වරද නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ පොදු පරිපාලන වෙනත් ආදායම් රු. 886,141 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී මෙම වරද නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (උ) සෞඛ්‍ය සේවා බලපත්‍ර ගාස්තු රු. 807,294 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී මෙම වරද නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයේ භෞතික සේවා හා වෙනත් ආදායම් රු. 372,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී මෙම වරද නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (එ) භෞතික සේවා මුලධන ආධාර රු. 59,269,425 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මූලධන ආධාර යටතේ රු. 59,269,425 ක ශේෂයක් ගිණුම්ගත කිරීමට නොහැකිවීම තුලින් එම වෙනස සිදු වී ඇති බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ සුහසාධක සේවාවට අදාල උපකරණ වැය, ඉඩම් වැඩි දියුණු කිරීම සඳහා දරන ලද වියදම රු. 59,565,837 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඔ) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ලද රු. 34,222,115 ක් සහ ඉන් දරන ලද වියදම් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ අතිරික්තය රු. 25,879,718 ක් වුවත් එය ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනයේ රු. 15,769,987 ක් ලෙස රු. 10,109,731 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.6.3** <u>නොසැසඳු පාලන ගිණුම් හා වාතර්ා</u>

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් හා ඉදිරිපත් කර තිබුණු උපලේඛන අතර රු. 50,366,865 ක වෙනසක් විය. | අදාළ ලේඛන හා උපලේඛන තවදුරටත් පරීක්ෂාකර මෙම වරද කඩිනමින් නිවැරදි කරන බව. | ලේඛන හා උපලේඛන යාවත්කාලීන කර නොසැසඳීම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

## 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ------------------------ | ------------------------ | -------------- |
| එකතු වටිනාකම රු. 1,717,502,186 ක් වූ වත්කම් විෂයයන් 08 ක් හා වගකීම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛනය, තක්සේරු වාර්තා සහ හිමිකම් ඔප්පු යනාදි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය, අනෙකුත් ලේඛන හා උපලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ලිඛිත සාක්ෂි මගින් තහවුරු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| --------------------------------- | ------------------------ | ----------------------- | ------------- |
| (අ)1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 19 (xii) වගන්තිය | තණමල්විල බස් නැවතුම්පොල කඩ කාමර 03 ක් 2007 වර්ෂයේ සිට වසර 30 ක කාලයක් සඳහා බදු දී තිබුණද ඊට අදාලව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට විෂයභාර නිලධාරි හට උපදෙස් ලබාදුන් බව. | පනතේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 24(1) වගන්තිය | සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව සභාවට අයත් මංමාවත් 256 ක් ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. | කඩිනමින් මාර්ග ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කරන බව. | පනතේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ඉක්ම වූ රු. 1,708,680 ක් වටිනා තැන්පතු ශේෂ 21 ක් නියාදනය කර නොතිබුණි. | එම ශේෂයන් පිළිබඳ සොයා බලා ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 83(1) වන වගන්තිය | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 80 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | නියාමන කටයුතු තව දුරටත් විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | සභා බලප්‍රදේශය තුල ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු නියාමනය කළ යුතුය. |
| (ඈ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් නඩත්තු කරනු ලබන වීථි පහන් සංගණනයක් සිදුකර නොතිබුණු අතර වීථි පහන් ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් ලබාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛය අනුව ගිවිසුම්ගත විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 23,211,085 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,360,922 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2023 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 60,000 | 140,000 | 140,000 | - | 50,000 | 162,500 | 162,500 | - |
| (ii) | කුලී | 13,420,720 | 1,959,950 | 1,538,178 | 421,772 | 13,190,170 | 1,772,700 | 8,102,426 | (6,329,726) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,051,580 | 1,051,580 | 1,679,586 | (628,006) | 1,235,465 | 1,235,465 | 1,390,595 | (155,130) |
| (iv) | වෙනත් ආදායම් | 87,711,407 | 87,711,407 | 10,867,803 | 76,843,604 | 58,270,788 | 58,270,789 | 2,274,129 | 55,996,660 |
| | **එකතුව** | 102,243,707 | 90,862,937 | 14,225,567 | 76,637,370 | 72,746,423 | 61,441,454 | 11,929,650 | 49,511,804 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු**<br>ඉකුත් වර්ෂවලට අදාලව සභාව සතු දේපල බදුදීම වෙනුවෙන් අයවිය යුතුව පවතින රු. 12,079,268 ක් සහ සමාලෝචිත වර්ෂයේ දේපල 06 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු. 199,324 ක් දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කිරීමට පියවර ගනිමින් සිටින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| **කුලී**<br>සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 2,077,350 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් රු. 540,250 ක් හෙවත් සියයට 26 ක ප්‍රමාණයක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් අය කිරීමට පියවර ගනිමින් සිටින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

**වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| (අ) 2015 – 2023 කාල පරිච්ඡේදයට අදාලව ජල පාරිභෝගිකයින් 537 ක ගෙන් අයවිය යුතු රු. 1,593,342 ක හිඟ ජල ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා ආදායම් පරීක්ෂකවරුන් වෙත උපදෙස් ලබාදී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) 2014 – 2023 කාල පරිච්ඡේදයට අදාලව වාහන හා යන්ත්‍රෝපකරණ කුලියටදීම වෙනුවෙන් අයවිය යුතු රු. 2,996,970 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | අදාල හිඟ අයකර ගැනීම සඳහා කටයුතු යොදා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 9,793,006 ක් සහ මුද්දර ගාස්තු රු. 2,484,655 ක් ගෙන්වාගෙන නොතිබුණි. | අදාල ආයතන වෙත ලිඛිතව දැනුම්දීම් සිදුකර ඇති අතර කඩිනමින් හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 2.3 අයිභාර

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ----------------------- | ------------------------------------- | ------------------ |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවල දී පනවන ලද අයිභාරයක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 52,608 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | වාරික වශයෙන් අදාල මුදල් අය වෙමින් පවතින බව දන්වන බව. | අයිභාර මුදල් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ දී ආරම්භ කරන ලද ආනන්දගම සහ නෙළුම් වැව ජල ව්‍යාපෘති මගින් ලබාදෙන ජලය බීමට සුදුසුද යන්න පිළිබඳව තත්ත්ව පරීක්ෂාවකට ලක්කර නොතිබුණි. ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 වගන්තිය අනුව මහජන සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | ජලය සඳහා තත්ත්ව පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය කටයුතු යොදන බව. | පානීය ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව පරීක්ෂණ සිදුකළ යුතුය. |

**3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශීය සභාවට අයත් සූරියආර කඩ කාමර පිහිටි ස්ථානයේ අනවසරයෙන් කඩ කාමර 03 ක් ඉදිකර තිබුණු අතර මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කඩ හිමියන් සමඟ සාකච්ඡා කර බදු පදනම මත මෙම කඩ කාමර සභාව වෙත පවරා ගිවිසුම් ගතවීමට එකඟ වූ බව. | සභා බලප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු නියාමනය කළ යුතුය. |
| (ආ) සභාවට අයත් ඉඩම් 14 ක හා සුසාන භූමි 94 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | මේ වන විට ඉඩම් හා සුසාන භූමි කිහිපයක් මැනුම් කිරීම සඳහා ගාස්තු ගෙවා ඇති අතර අනෙකුත් ඉඩම් පවරා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බව. | සභාව සතු ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) 2023 වර්ෂයේදී ලැබී තිබුණු කාර්යාල උපකරණ 04 ක් සහ ජල ටැංකි 02 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී එම වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව සභා බලප්‍රදේශයේ සංවර්ධන මට්ටම් සැලකිල්ලට ගෙන දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ගාස්තු අයකර නොතිබුණි. | මේ වන විට මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | දියුණු කළ ප්‍රදේශ සම්බන්ධයෙන් වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ගාස්තු අයකළ යුතුය. |
| (ආ) 2023 වර්ෂයේ සභාව සතු ස්ථාන 11 ක පිහිටි කඩ බිම් 42 ක් තුන් අවුරුදු බදු පදනම මත බදු දීමේදී අවම ලංසු මුදල තීරණය කිරීම සඳහා වෘත්තීය තක්සේරුකරුවන් මගින් තක්සේරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී විධිමත්ව තක්සේරු කර බදුදීමට කටයුතු කරන බව. | කඩ කාමරවල වටිනාකම සම්බන්ධයෙන් විධිමත් තක්සේරුවක් සිදුකළ යුතුය. |
| (ඇ) සභාවට අයත් ස්ථාන 06 ක පිහිටි කඩ කාමර 61 කට අදාලව මාසික බදු මුදල තීරණය කිරීමේදී වෘත්තීය තක්සේරුකරුවන්ගේ සහය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී විධිමත්ව තක්සේරු කර බදුදීමට කටයුතු කරන බව. | කඩ කාමරවල වටිනාකම සම්බන්ධයෙන් විධිමත් තක්සේරුවක් සිදුකළ යුතුය. |
| (ඈ) සූරියආර අංක 01 සිට අංක 07 දක්වා කඩ කාමරවලට අදාලව 2014 වර්ෂයේ තක්සේරු වාර්තා අනුව මාසික කුලී අයකරමින් පැවති අතර කඩ කාමර කුලී කාලීනව තක්සේරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී විධිමත්ව තක්සේරු කර බදුදීමට කටයුතු කරන බව. | කඩ කාමරවල වටිනාකම සම්බන්ධයෙන් විධිමත් තක්සේරුවක් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) 2023 පෙබරවාරි 06 දින සභාව සතු කඩබිම් 42 ක් ටෙන්ඩර් මගින් බදු දී තිබුණද එයින් කඩ බිම් 09 ක් බදුදීමට අදාලව ගිවිසුම්වලට එළඹී නොතිබුණි. එසේම මේ සඳහා අයවිය යුතු රු. 3,173,000 ක මූලික මුදල් 2024 පෙබරවාරි 05 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකරන බව. | අදාල මුදල් විධිමත්ව අයකරගත යුතුය. |
| (ඊ) ප්‍රාදේශීය සභාව විසින් බදු දී ඇති කඩ කාමර 31 ක බදු ගිවිසුම්වල වලංගු කාලය ඉකුත් වී වසර 1 සිට වසර 09 දක්වා කාලයක් ගත වි තිබුණද බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වර්ෂය තුල නව තක්සේරුවට අනුව සියලුම කඩ කාමර සම්බන්ධයෙන් ගිවිසුම්ගතවීමට නියමිත බව. | සභාව සතු දේපල බදු දීමේදී එම කටයුතු විධිමත්ව සිදුකළ යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| තණමල්විල ප්‍රාදේශීය සභාවට අයත් ඩංඩුම සතිපොල අසල අංක 05 සහ අංක 06 කඩ කාමර 2019 වර්ෂයේදී බදු දී තිබුණු අතර එහිදී ප්‍රසම්පාදන ලංසු මුදලින් සියයට 50 ක මූලික මුදල රු. 1,500,200 ක් ගෙවූ බවට කඩ කාමර බදුදීමට අදාල ලිපි ගොනුවල දක්වා තිබුණද එම මුදල සභා අරමුදලට බැර වී නොතිබුණි. | අදාළ මුදල් සභා අරමුදලට බැරවී නොමැති බව පරීක්ෂාවේදී තහවුරු වන අතර මේ පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇති බව. | අදාළ ගනුදෙනුව සම්බන්ධයෙන් සොයා බලා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගත යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| (අ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 03 ක නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | වාහනවල නීත්‍යානුකූල අයිතිය කඩිනමින් පවරා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) තණමල්විල ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 22 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර ඉන් වාහන 07 ක් සඳහා ලියාපදිංචි සහතිකයද ලබාගෙන නොතිබුණි. වාහන 10 කට අදාලව වසර 01 සිට 22 ක කාලයක් සඳහා අදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | මෙම ගැටළුව කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නියමිත කාලය තුල වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. |
| (ඇ) ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 08 ක් වසර 01 සිට වසර 18 ක කාලයක් දක්වා අක්‍රීයව පවතින අතර අදාල වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි පියවර කඩිනමින් ලබා ගන්නා බව. | අක්‍රීයව පවතින වාහන අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සෙවනගල පිහිටි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ ගොඩනැගිල්ල, හලර් යන්ත්‍රය හා මෝටරය සහ කෙසෙල් නැටි කපන යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. | පවතින අනෙකුත් ප්‍රායෝගිකව ගැටළු විසඳාගෙන කඩිනමින් පොහොර නිපදවීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කළ යුතුය. |
| (ඉ) සභා අරමුදලින් රු. 1,967,506 ක පිරිවැයක් දරා 2019 වර්ෂයේ ඉදිකරන ලද නුගේගලයාය සතිපොල භූමියේ පිහිටි කඩ කාමර 03 ක් 2023 වර්ෂය අවසන් වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | අවස්ථා කිහිපයකදීම මෙම කඩ කාමර ටෙන්ඩර් කළද ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් බදු දීමට නොහැකි වී ඇති බව. | සභාව සතු වත්කම් කාර්යක්ෂමව උපයෝජනයට ගත යුතුය. |
| (ඊ) සභාව සතු කැබ් රථයේ එන්ජින් අංකය 4D56DE9507 කි. ලියාපදිංචි සහතිකයේ එන්ජින් අංකය 4D56JN0914 වී තිබුණි. | නව එන්ජිමක් සවිකළ බවට තොරතුරු ගොනුවේ අඩංගු නොවන බැවින් මේ පිළිබඳව විධිමත් විමර්ශනයක් සිදු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉල්ලීමක් සිදුකර ඇති බව. | සභාව සතු වත්කම් පරිහරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතුය. |
| (උ) සභාවට අයත් ට්‍රැක්ටර් රථ 02 ක් සඳහා ලියාපදිංචි සහතික සභාව සතුව නොතිබුණි. | මෙම රථ සභාවට ලැබුණු ආකාරය පිළිබඳ කිසිදු ලේඛනයක් සභාවේ නොමැති බව. | සභාව සතු වත්කම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගත යුතුය. |

## 3.6 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
| --- | --- | --- |
| 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛ අංක 08 හි 6.2.2 ඡේදය අනුව ජාතික තරඟකාරි ලංසු කැඳවීමකදී අවම වශයෙන් දින 21 ක කාලයක් ලබාදිය යුතු බව දන්වා තිබුණද 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් දේපල බඳුදීමට අදාලව ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 14 ක කාලයක් පමණක් ලබාදී තිබුණි. | ඉදිරියේදී මෙවැනි ගැටළු අවම කර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදුකළ යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
| --- | --- | --- |
| 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව වැඩ සම්පූර්ණ කිරීමට ඇති හැකියාව පිළිබඳව සෑහීමකට පත්වේ නම් අනුමත සමිතිවලට රු. 200,000 ක උපරිමයකට යටත්ව අත්තිකාරම් ලබාදිය හැකිය. නමුත් ඊට අනුකූල නොවන ලෙස තලපත්ගම ප්‍රජාශාලාව ඉදිකිරීම සඳහා සමිතියක් වෙත රු. 399,247 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. 2024 පෙබරවාරි 02 දිනවන විටත් එම අත්තිකාරම් මුදල පියවා නොතිබුණි. | ඉදිරියේදී එම මුදල පියවා ගැනීමට කටයුතු කරන බව. | ඉදිකිරීම් කටයුතු විධිමත් විය යුතු අතර විනිවිධභාවයෙන් යුක්ත විය යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 04 කට අදාලව සේවකයින් 06 දෙනෙකුගේ පුරප්පාඩු සහ තනතුරු 02 කට අදාල නිලධාරීන් 02 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | අදාල දැනුවත්කිරීම් සිදු කළද නව බඳවාගැනීම් අත් හිටුවා ඇති බැවින් පුරප්පාඩු පිරවීම සිදු නොවූ බව හා පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අදාල තොරතුරු දන්වා ඇති බව. | සේවක පුරප්පාඩු පිරවීමටත් අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) සේවකයින් 09 දෙනෙකුට ලබාදී තිබුණු වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 298,279 ක ණය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙම ගැටළුව කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | සේවක ණය ශේෂ කඩිනමින් අයකරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/01-2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | ඉදිරියේදී නියමිත පරිදි විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමට අපේක්ෂා කරන බව. | අදාල පනත් සහ චක්‍රලේඛ අනුව විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 07 ක සියයට 11 සිට සියයට 133 දක්වාද වියදම් විෂයයන් 06 ක සියයට 14 සිට සියයට 99 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී අයවැය සකස් කිරීමේ කටයුතු තවදුරටත් තාත්වික අයුරින් සිදු කිරීමට අපේක්ෂා කරන බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් සෙවනගල පවත්වාගෙන යනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණු අතර මෙම ඒකකය ආරම්භකර වසර 13 ක් වැනි දීර්ඝ කාලයක් ගත වී තිබුණද කාබනික පොහොර නිපදවීමට කටයුතු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ගැටළු විසඳාගෙන කාබනික පොහොර නිපදවීමට අපේක්ෂා කරන බව. | කසල කළමනාකරණ කටයුතු විධිමත් කළ යුතුය. |